## විරුද්ධාභාස හා පරස්පර

මේ ලිපිය අපේ ප්‍රවාද ලිපි පෙළට අයත්වන්නක් නො වේ. අපේ ප්‍රවාද ලිපි පෙළ ලියන්නේ සිංහල බෞද්ධ චින්තනයෙහි අපේ දැනුම් පද්ධතීන් නිර්මාණය කරගැනීම සඳහා ය. ඒ ලිපි පෙළට විරුද්ධ ව ඉදිහිට විද්‍යුසර පුවත්පතෙහි ම ලිපි පළවෙතත් බොහෝ විට මම ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර නො දක්වමි. අවස්ථා දෙක තුනක දී පමණක් එසේ ප්‍රතිචාර දක්වා ඇතත් එය ද ලිපි පෙළෙහි තේමාවට, ඒකගුතාවට හා රිද්මයට බාධා නො පැමිණෙන අයුරින් ය. මගේ මතකය අනුව ඒ කිසි අවස්ථාවකවත් මා ප්‍රතිචාර දක්වන්නේ කාහට දැයි සඳහන් නො කෙළෙමි. මගේ මතකය එසේ වුවත් නම සඳහන් කර ප්‍රතිචාර දැක් වූ අවස්ථාවක් ඇතැයි යමකු නිදර්ශන සහිත ව පෙන්නුම් කරන්නේ නම් ඒ ගැන කෘතඥ වෙමි. කපිල පීරිස් මහතා පසුගිය සති කිහිපයක පළ කළ ලිපිවල සඳහන් ඇතැම් කරුණු සම්බන්ධයෙන් පමණක් ඒ ක්‍රමය ම අනුගමනය කරමින් ප්‍රතිචාර දැක්විමි. ලිපි පෙළෙහි කැඩීමකින් තොරව අදහස් ගලාගෙන යෑමට ඉඩ සැලැස්වීම මගේ අරමුණ විය.

මා ප්‍රතිචාර දැක්වුයේ කපිල පීරිස් මහතා දැක්වූ ඇතැම් අදහස් සම්බන්ධයෙන් පමණකි. ඉන් කියැවෙන්නේ ඔහු ඒ ලිපිවලින් ගෙනහැර දැක්වූ අනෙක් සියළු කරුණු මා අනුමත කරන බව හෝ ඒ සමඟ එකඟ වන බව හෝ නො වේ. මා මේ ලිපි පෙළෙහි යම් ප්‍රතිචාරයක් දක්වන්නේ අප විසින් පසුගිය අවුරුදු විසිපහක පමණ කාලයක තිස්සේ වර්ධනය කෙරුණු මතවාදයට සෘජුව පහරක් එල්ලවන අවස්ථාවල ය. කපිල පීරිස් මහතාගේ ලිපිවල ද විශේෂයෙන් ම ඔහුගේ ගණිතය හා සෛද්ධාන්තික භෞතික විද්‍යාව පිළිබඳ වූ වැරදි දැනුම් පදනම්කරගෙන සඳහන්වන සාවද්‍ය කරුණු (ඒ මොනවාදැයි කීමට අපේ ප්‍රවාද ලිපි පෙළින් හෝ මේ ලිපියෙන් හෝ බලාපොරොත්තු නො වෙමි. ඒ වෙනත් ආකාරයකට කිරීම මගේ අදහස ය.) ඇතත් ඒ සෘජුව ම අපේ මතවාදයට පහරක් නොවන බැවින් ඒ පිළිබඳ ව ප්‍රතිචාර නොදැක්වීම මගේ ප්‍රතිපත්තිය වෙයි. එබැවින් මා ඔහුට ප්‍රතිචාර නොදැක්වූ පමණින් අදාළ අදහස් මා අනුමත කර ඇතැයි යන නිගමනයට පැමිණිය යුතු නො වේ.

කපිල පීරිස් මහතා දැන් දැන් පැහැදිළිව ම අපේ මතවාදයට ප්‍රතිවිරුද්ධ මතවාදයක් ගෙනහැර දක්වනවා පමණක් නොව අපේ මතවාදය සංශෝධනය කරමින් වෙනත් මතවාදයක් ඉදිරිපත් කරයි. ඒ අතර මට ඉතා භයානක චෝදනාවක් ද කරයි . ඒ මා <u>බුද්‍ධදහම</u> හිතුමතේ විවරණය කරන බව ය. විද්‍යුසර කතුතුමා ඒ කොටස, <u>බුද්‍ධදහම</u> විවිධාකාරයෙන් විවරණය කරන බවට, සුළු සංශෝධනයක් සහිත ව උපුටා දක්වා ඇත්තේ එහි ඇති වැදගත්කම නිසා විය යුතු ය. ඒ සංශෝධනය කපිල පීරිස් මහතාගේ අනුදැනුම ඇතිව කෙරෙන්නට ඇත. එසේ නම් මා <u>බුද්‍ධදහම</u> හිතුමතේ විවරණය කරන්නේ ය යන්නෙහි ඇති බරපතළ කම ඒ මහතා අවබෝධ කරගත්තා විය හැකි ය. ඒ සංශෝධනය කාගේ අවශ්‍යතාව මත කෙරුණත් කපිල පීරිස් මහතා තම මුල් ලිපියෙහි ලියා ඇත්තේ මා <u>බුද්‍ධදහම</u> හිතුමතේ විවරණය කරන බව ය. ඒ ඔහු මා ගැන සිතන ආකාරය ය. ඇතැම් විට ජනතාව සම්බන්ධයෙන් ගත්කල ඒ " සැර වැඩි" යැයි සිතා ඔහු ඒ සංශෝධනය කරන්නට ඇත. " සැර වැඩි" කම බරපතළ බව ආදිය ගැන ඔහු කල්පනා කරන්නේ ජනතාවට ඒ එසේ ඉදිරිපත්කිරීම සම්බන්ධයෙන් මිස ඔහු මගේ හිතුමතේට කරන විවරණ සම්බන්ධයෙන් ඔහු සිතන ආකාරයේ වෙනසක් වූ නිසා යැයි කිව නො හැකි ය. ඔහුගේ ප්‍රකාශය කර ඇත්තේ මා දාගැබ් ආදිය සම්බන්ධයෙන් නිවිටන්ගේ ප්‍රවාද යොදාගැනීම ප්‍රශ්න කරන සන්දර්භයක ය. අදාළ පාඨය පසුව ඉදිරිපත් කරමි. ඉහත සඳහන් කරුණු දෙක එනම් අපේ මතවාදය සංශෝධනය කරමින් වෙනත් මතවාදයක් ඉදිරිපත් කිරීම, මට විරුද්ධව භයානක චෝදනාවක් කිරීම, හා තුන්වැනුව විද්‍යුසර පාඨකයන් යම් පිරිසක් හෝ කපිල පීරිස් මහතා අපේ මතවාදය පිළිගන්නා කෙනකු ලෙස සිතා නොමඟ යෑමට හා අවුලකට පත්විමට ඉඩ ඇතැයි යන කරුණ හේතුවෙන් අපේ ප්‍රවාද ලිපි පෙළෙන් බැහැර වී කපිල පීරිස් මහතාට පිළිතුරු දීම අවශ්‍ය වෙයි.

පළමුවනේ ම කිවයුත්තේ ඒ මහතා ද ප්‍රකාශ කරන අයුරින් ඒ මහතා මගේ ශිෂ්‍යයෙක් නො වේ, ඒ මහතා මගේ ලිපි හා පොත්පත් කියවා ඇති නමුත් ශිෂ්‍යයකු නොවන බව පවසයි. ලිපි කියවීමෙන් පමණක් ශිෂ්‍යයකු වන්නේ නම් අප සියලු දෙනා ම බොහෝ අයගේ ශිෂ්‍යයන් විය යුතු බව මම ද පිළිගනිමි. මම ඒ මහතාට පාසලේ දී හෝ විශ්වවිද්‍යාලයේ දී හෝ අපේ නිවසේ දී හෝ උගන්වා නැත්තෙමි. මා සිතන අයුරින් ඒ මහතා විශ්වවිද්‍යාල ශිෂ්‍යයකු ව සිටි අවධියෙහි යම් කාල පරිච්ඡේදයක පමණක් මම විශ්වවිද්‍යාල ආචාර්යවරයෙක් වීමි. ඉතිරි කාල පරිච්ඡේදයෙහි මම රැකියා විරහිත,

© Prof. Nalin De Silva

අවශ්‍ය නම් දර්ශන ශූරී (ආචාර්ය) උපාධිධාරියෙක් වීමි. හැරත් මා ඉගැන්වූයේ බොහෝ දෙනා සිතන අයුරින් ඉංජිනේරු පීඨය වැනි දක්ෂ ශිෂ්‍යයන් ඉගෙන ගන්නා පීඨයක නො වේ. මා ඉගෙනගත්තේත් ඉගැන්වූයේත් සාමාන්‍යයෙන් ඉංජිනේරු පීඨයට ඇතුළත් වීමට නොහැකි සිසුන් ඇතුළුවන විද්‍යා පීඨවල ය. කපිල පීරිස් මහතා ඒ පීඨවල ඉගැන්වෙන ගණිතය ගැන එතරම් උසස් අන්දමකට (ඒ මහතාගේ වචනවලින් නම් මහා ලොකුවට) නොසිතන්නේ ඒ නිසා දැයි නො දනිමි. ඒ පිළිබඳ නිදර්ශන ඒ මහතාගේ ලිපිවලින් ම ඉදිරිපත් කරමි.

සැප්තැම්බර් 9 දා පළවූ ලිපියෙහි ඒ මහතා මෙසේ කියයි. " අප විශ්වවිද්‍යාලයේ සිටිය දී සීමාව, ස්පර්ශක ඇඳීම සහ ඒ ආශ්‍රිත ගැටලු පිළිබඳ ව අපට මුලින් ම හැඟීමක් ඇති කළේ එතුමා (නලින් ද සිල්වා) ය. එහෙත් මාගේ සීමාවේ සීමාව ලිපියේ එතුමා පිළිබඳ ව සඳහන් නොවීම පිළිබඳ ව කණගාටු වෙමි. කෙසේ වුව ද ඉංජිනේරු විද්‍යාවේ දී පද්ධති සඳහා අදාළ අවකල සමීකරණ ගොඩනැගීමේ දී බටහිර ක්‍රමයට අනුව ඇතිවන ගැටලු පිළිබඳව මා හොඳින් දැනගත්තේ මා ඉංජිනේරු විද්‍යාව හදාළ නිසා ය. මෙහි දී ගැටලුව ඇතිවන්නේ අවකල සමීකරණ විසඳීමේ දී නොව ගොඩනැඟීමේ දී ය. එහි දී කුඩා කොටසක් සඳහා භෞතික විද්‍යා සමීකරණ ලියා අවසානයේ සීමාව හරහා එම කොටස නැතිකර දමයි. අපගේ ගැටලුව එයයි..එහෙත් ද්විකෝටිකයෙන් මිදුණු විගස අපට එය ගැටලුවක් නො වේ. ගණිතඥයන් බොහෝ විට කරන්නේ අවකල සමීකරණ විසඳීම ය. එවා ගොඩනඟන්නේ ව්‍යවහාර විද්‍යාවට අදාළ උදවිය ය."   මා කළ ඇත්තේ ඔහුට යම් යම් ගැටලු පිළිබඳ ඉගැන්වීමක් නොව හැඟීමක් දීම පමණ ය. ඔහුට අදාළ කරුණු ගැන අවබෝධයක් ඇති වී තිබෙන්නේ ඔහු ඉංජිනේරු විද්‍යාව හදාළ නිසා ය. මෙයින් ඔහු කීමට අදහස් කරන්නේ ඉංජිනේරු තාක්ෂණයේ දී (බටහිරයන්ට අනුව ඉංජිනේරු විද්‍යාවක් නැත. ඇත්තේ තාක්ෂණයකි. මා බටහිරයන්ගේ වර්ගීකරණ අගයන්නකු නොවුව ද බටහිර දැනුම ගැන කතා කිරීමේ දී ඔවුන්ගේ වචන අදාළ ආකාරයෙන් යොදාගත යුතු යැයි සිතමි.) එතරම් අශිථිල (rigorous) නොවන බව ද? ඒ එසේ විය හැකි ය. එහෙත් ගණිතඥයන් බොහෝ විට කරන්නේ අවකල සමීකරණ විසඳීම ය යනුවෙන් ඔහු කියන දෙය වැරදි ය.

ඇතැම් තැනක අවකල සමීකරණ ගොඩනඟන්නේ ව්‍යවහාරික විද්‍යාඥයන් විය හැකි ය. එසේ ගොඩනැගීමේ දී ඔවුන් ගණිතඥයන් මෙන් අශිථිල නොවන බව අපි දනිමු. මම ද වෘත්තියෙන් නම් ව්‍යවහාරික ගණිතඥයෙක් මිස ශුද්ධ ගණිතඥයෙක් නො වෙමි. එහෙත් අප ශුද්ධ ගණිතඥයන් බටහිර වූ පමණින් ඔවුන් කරන දේ අවතක්සේරු කළ යුතු නො වේ. ශුද්ධ ගණිතඥයන් අවකල සමීකරණ ගොඩනැගීම, විසඳීම, විසඳුම් පවත්නේ කිනම් අවශ්‍යතා යටතේ ද හා ඒ සම්බන්ධයෙන් සාධනය කර ඇති ප්‍රමේය ආදිය පමණක් නොව එහි අනන්‍යතාව (uniqueness) ගැන ද කර ඇති අධ්‍යයනයන් ගැන කපිල පීරිස් මහතා නොදන්නේ නම් ඒ ගැන කතාකිරීම අපේ සදාචාරයට ද එකඟ නො වේ. ඒ මහතාගේ සීමාවේ සීමාව ලිපියේ මා එකඟ නොවන කරුණු ඇතත් ඒ සියල්ලට ප්‍රතිචාර දැක්වීම මගේ ප්‍රතිපත්තිය නොවන බව නැවතත් අවධාරණය කළ යුතු ය. විරුද්ධාභාස ගැන මා කෙටියෙන් දැනරමත් සඳහන් කර ඇත. ඒ වියුක්තය පිළිබඳ ප්‍රශ්නයක් නොව ඇරිස්ටෝටලීය න්‍යාය පිළිබඳ ප්‍රශ්නයක් බව පමණක් මා කියා ඇත්තේ අපේ චින්තනයෙහි වියුක්තය නැතත් අප වියුක්තය හෙළා නොදැකිය යුතු බැවින් හා වියුක්තය අපේ චින්තනයට යම් පමණකින් හෝ අවශෝෂණය කර නොගෙන අපට බටහිරයන්ගේ දැනුමට අභියෝග කළ නොහැකි නිසාත් ය. ඒ කෙසේ වෙතත් ද්විකෝටිකයෙන් මිදුණු විගස අපට ඒ ගැටලුවක් නොවන්නේ යැයි උක්ත ලිපියෙහි ඒ මහතා සඳහන් කරයි. ඒ මහතාට ද්විකෝටිකයෙන් මිදීමට ඉගැන්වයේත් ඉංජිනේරු තාක්ෂණය දැයි මම නො දනිමි. ඇරිස්ටෝටලිය න්‍යායෙහි ඇති අඩුපාඩුකම් අතර අනන්තය පිළිබඳ ප්‍රශ්නය ද ඇත. අනන්තය පිළිබඳ නොයෙකුත් විරුද්ධාභාස ගොඩනගා ඇත්තේ ඒ හේතුවෙනි. ඒ ගැන මට අවශ්‍ය ප්‍රමාණයට මා සඳහන් කර ඇත. කපිල පීරිස් මහතා ඊනියා පින්තාරුකරුගේ විරුද්ධාභසයට විසඳුමක් දී නැති බව පමණක් කිව යුතු ය.

2009 සැප්තැම්බර් මස 02 වැනි දින පළවූ ලිපියෙහි කපිල පීරිස් මහතා මෙසේ කියයි. "අපගේ ගණිතය හා සම්බන්ධ ලිපි ......... මහතාගේ ද විමසුමට ලක් වූ එවා ය. එවා හුදෙක් ඉංජිනේරු ගණිතය මත පදනම් වූ දැ නො වේ. කෙසේ වෙතත් ඉංජිනේරු ගණිතයට වඩා මහා ලොකු යථාර්ථයක් අනෙක් ගණිතයේ නොමැති බව ද සඳහන් කළ යුතු ය. එහි වියුක්තිය වැඩි ය. වියුක්තිය වැඩි වීමේ විශේෂ හොඳක් නැත. එසේ ම බටහිර අර්බුදය ඇත්තේ වියුක්තකරණයේ පමණක් නො වේ."  මා නැවතත් සඳහන් කරන්නේ මා බටහිර ශුද්ධ ගණිතඥයකු නොවන බව ය. බටහිර ගණිතයෙහි ඇති දුර්වලකම් සුළු ප්‍රමාණයක් වුව ද ඇතැම් විට මුළු ලෝකයෙන් ම පළමුව කියා ඇත්තේ මා විය යුතු ය. ලංකාවේ නම් ඇතැම් විට බටහිර ගණිතයේ නොයෙකුත් අංශවල අඩුපාඩුකම් පළමු වරට පෙන්වා දුන්නේ

© Prof. Nalin De Silva

මා විය යුතු ය. ලංකාවේ ගණිතය පිළිබඳ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් බොහෝ දෙනකු ද ගර්ඩිල් ප්‍රමේයය පිළිබඳ දැන නොසිටි වකවානුවක ඒ ශිෂ්‍යයන් අතර ද කතාකරන මාතෘකාවක් බවට පත්කෙළේ මා යැයි සිතමි. කපිල පීරිස් මහතා ඒ ගැන මගෙන් ඉගෙන නොගන්නට ඇත. ඒ ගැන මා ඔහුට හැඟීමක්වත් ඇති කෙළේ දැයි නො දනිමි. ඒ කෙසේ වුවත් බටහිර ගණිතය මා අතින් විවේචනයට ලක්වුව ද ඒ අවතක්සේරු කිරීම මගේ ප්‍රතිපත්තිය නො වේ. කපිල පීරිස් මහතා තේරුම් නොගත්තාට වියුක්තය යම් ප්‍රමාණයකට හෝ වැඩිවීමෙන් බටහිර දැනුමට ශක්තියක් ලැබී ඇත. වියුක්තය ගැන මා විදුසරට ලියා ඇති ලිපි කියවීමෙන් ඒ මහතාට ඒ පිළිබඳ හැඟීමක් ලබාගත හැකි ය.

කපිල පීරිස් මහතා ඉහතින් උපුටා දක්වා ඇති කොටසින් කියන්නේ කුමක් ද? “කෙසේ වෙතත් ඉංජිනේරු ගණිතයට වඩා මහා ලොකු යථාර්ථයක් අනෙක් ගණිතයේ නොමැති බව ද සඳහන් කළ යුතු ය. එහි වියුක්තිය වැඩි ය. වියුක්තිය වැඩි වීමේ විශේෂ හොඳක් නැත.” මම යථාර්ථය ද ප්‍රතික්ෂෙප කරමි. ඒ පිළිබඳ වෙනත් අයකු සමග, යථාර්ථයක් ඇතැයි කියන සිංහල බෞද්ධයකු සමග මම වෙනත් පුවත්පත්වල වාදයක පැටලී සිටිමි. එහෙත් මහා ලොකු යථාර්ථයක් අනෙක් ගණිතයේ එනම් බටහිර විද්‍යා පීඨවල ඉගැන්වෙන ශුද්ධ ගණිතයෙහි නොමැති බව සඳහන් කරන විට කපිල පීරිස් මහතා කියන්නේ යථාර්ථයක් නැතැයි  කීම නොවන බව පැහැදිලි ය. ඔහු කියන්නේ තමන් ඉගෙනගත් ඉංජිනේරු ගණිතයට වඩා මහා ලොකු දෙයක් විද්‍යා පීඨවල ඉගැන්වෙන ගණිතයෙහි නැති බව ය. ඉන් නො නැවතී ඔහු කියන්නේ විද්‍යා පීඨ ගණිතයෙහි වියුක්තිය වැඩි වුවත් එහි විශේෂ හොඳක් නැති බව ය. මේ බාල තර්ක ය. සිරි අයියාගේ ගීයක අයියා අම්මා සුදු බව හොඳ ගුණයක් ලෙස සඳහන් කළ විට එසේ නම් පොල් බැයත් හොඳ දැයි තර්ක කළ නංගී මෙහි දී සිහියට නැගෙයි. වියුක්තය ගැන එසේ කියා ඒ මොහොතේ ම බටහිර අර්බුදය ඇත්තේ වියුක්තකරණයේ පමණක් නො වේ යැයි ඒ මහතා කියයි.

කපිල පීරිස් මහතා මට සිහි ගන්වන්නේ එකක් කඩතොළු මකාගන්නට ගොස් තවදුරටත් අමාරුවේ වැටුණු ආචාරියා ය. විරුද්ධාභස ගැන කතාකරන ඒ විසඳීමට තැත්කරන කපිල පීරිස් මහතාට පරස්පර නොමැතිව වාක්‍ය කිහිපයක් ලිවිය නො හැකි ය. තමාගේ ගණිතයට සම්බන්ධ ලිපි විද්‍යා පීඨ ගණිතඥයකුගේ විමසුමට ලක් වූ බව එක් අතකින් කියන ඒ මහතා ඒ විගසම විද්‍යා පීඨ ගණිතයෙහි ඇති මහා ලොකු යථාර්ථය කුමක් දැයි අසයි. ඒ අතර වියුක්තයක් ගැන කියා එහි විශේෂ හොඳක් නැති බවත් එහෙත් අර්බුදය ඇත්තේ වියුක්තකරණයේ නොවන බවත් කියයි. කපිල පීරිස් මහතා තමන්ට කීමට ඇති යමක් නොකියා පරස්පරවල පැටළෙයි. ඔහු මගේ ශිෂ්‍යයකු නොවන බව නම් පැහැදිලි ය. (මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva